# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

***

## පුවත්පත් නිවේදනය

## <u>ඉන්දීය මුදල් අමාත්‍යතුමිය ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවල නව ව්‍යාපෘතීන් රැසක් සමාරම්භ කරයි</u>

- බෞද්ධ බැඳීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානය වහාම ක්‍රියාවට නැංවීම
- ශ්‍රී ලංකාව පුරා සිද්ධස්ථාන සඳහා සූර්ය විදුලිබලය ලබා දීමට ඇමරිකානු ඩොලර් මිලියන 10ක් වෙන් කිරීම
- ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශවල නිවාස 10,000ක් ඉදි කිරීම ඇරඹීම
- නවීකරණය කරන ලද තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීම
- පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 10,000ක් සඳහා පාසල් බෑග් සහ අභ්‍යාස පොත් ලබා දීම
- පාසල්වල RO ජල පිරිපහදුකරණ ඒකක සවි කිරීම

ඉන්දීය මුදල් අමාත්‍ය නිර්මලා සීතාරාමන් මහත්මිය ප්‍රධාන පස් සාමාජික නිල නියෝජිත පිරිසක් සහ කොන්ෆෙඩරේෂන් ඔෆ් ඉන්දියන් ඉන්ඩස්ට්‍රි (CII) සහ ෆෙඩරේෂන් ඔෆ් ඉන්දියන් චේම්බර්ස් ඔෆ් කොමර්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රි (FICI) වැනි ප්‍රමුඛ පෙළේ කර්මාන්ත සංවිධානවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ව්‍යාපාරික නියෝජිත පිරිසක් 2023 නොවැම්බර් 1-3 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ.

2. මුදල් අමාත්‍ය නිර්මලා සීතාරාමන් මහත්මිය සංචාරය අතරතුරදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා හමු විය. එතුමිය අස්ගිරි සහ මල්වතු මහා නාහිමිපාණන්

වහන්සේලා හමු වී ආශිර්වාද ලබාගත් අතර මහනුවර ශ්‍රී දළදා මාලිගාව සහ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙන්ම යාපනය නල්ලූර් කන්දසාමි කෝවිල ද වැඳ පුදා ගත්තාය. ඉන්දීය සම්භවයක් ඇති දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් පැවති “නාම් 200” උලෙළේ ගෞරවනීය අමුත්තා වශයෙන් සහභාගී වූ එතුමිය සම්බන්ධකතාවය ඉහළ නැංවීම; සෞභාග්‍යය සඳහා හවුල්කාරීත්වයක් ගොඩනැගීම යන මැයෙන් පැවති ඉන්දියා - ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුවෙහි ප්‍රධාන දේශනය ද සිදු කළාය. එසේම, එතුමිය සිය සංචාරය අතරතුරදී ත්‍රිකුණාමලය සහ යාපනය ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා ශාඛාවන් විවෘත කළාය.

3. එතුමිය 2023 නොවැම්බර් 2 වන දින ශ්‍රී ලංකා ජනාධිපතිතුමා සමඟ ඵලදායී සාකච්ඡාවල නිරත වූ අතර එහිදී දෙරට අතර බෞද්ධ සබඳතා ප්‍රවර්ධනය සඳහා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානය යටතේ ව්‍යාපෘතීන් කඩිනමින් ඇරඹීමට මඟ විවර කරමින් ද්විපාර්ශවික ලේඛන ද හුවමාරු කර ගන්නා ලදී. මෙම ප්‍රදානය යටතේ ප්‍රථම ව්‍යාපෘතිය වශයෙන් ශ්‍රී ලංකාව පුරා සිද්ධස්ථාන සඳහා සූර්ය විදුලිබලය ලබා දෙනු ඇති අතර ඒ සඳහා වෙන් කර ඇති මුදල ඇමරිකානු ඩොලර් මිලියන 10කි. මෙම ව්‍යාපෘතියට අදාළ අවබෝධතා ගිවිසුම ද ඊයේ දින හුවමාරු කර ගන්නා ලදී.

4. ඉන්දීය මුදල් අමාත්‍යතුමිය “නාම් 200” උලෙළේදී ඉන්දීය රජය වතුකර ප්‍රදේශවල විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) විෂයන් සඳහා ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් ඉක්මනින් ශ්‍රී ලංකාවට එවන බව සඳහන් කළාය. 2023 ජූලි මස අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ඉන්දීය සම්භවයක් සහිත ද්‍රවිඩ ප්‍රජාව සඳහා ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා රුපියල් බිලියන 3ක බහු ආංශීය පැකේජය යටතේ ක්‍රියාත්මක කෙරෙන පළමු ව්‍යාපෘතියක් වශයෙන් මේ සඳහා සුදුසුකම්ලත් පුහුණුකරුවන් නිශ්චිත කාලසීමාවන් සඳහා ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට එවනු ඇත. වතුකම්කරුවන් සඳහා සූර්ය විදුලි ලාම්පු, ස්වයං උපකාර කාන්තා කණ්ඩායම් සඳහා මහන මැෂින් යනාදිය ඇතුළු මෙම පැකේජය යටතේ ක්‍රියාවට නැංවෙන තවත් ව්‍යාපෘතීන් රැසක්

පිළිබඳව ද සීතාරාමන් මහත්මිය මෙහිදී සඳහන් කළාය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා වතුකර ප්‍රදේශවල පාසල් දරු දැරියන් 10,000ක් සඳහා අභ්‍යාස පොත් සහ පාසල් බෑග් ලබා දීමේ වැඩසටහන සහ තෝරා ගන්නා ලද පාසල්වල පානීය ජල ගැටළුවලට විසඳුම් වශයෙන් ජල පිරිපහදුකරණ RO ඒකක ලබාදීමේ ව්‍යාපෘතිය ද එතුමිය විසින් සමාරම්භ කරන ලදී.

5. නව සංඩිස්ථානයක් සනිටුහන් කරමින් එතුමිය වතුකම්කරුවන් සඳහා නිවාස 10,000ක් ඉදිකිරීම සඳහා වන ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර ද ශ්‍රී ලංකා ජනාධිපතිතුමා සමඟ එක්ව මාර්ගගත ක්‍රමය ඔස්සේ සමාරම්භ කළාය. මෙය වතුකර ප්‍රදේශවල දැනටමත් ආසන්න වශයෙන් නිවාස 4000ක් සාදා නිම කර ඇති තෙවන අදියරේ දිගුවකි. ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ මේ දක්වා නිවාස 50,000ක් පමණ සාදා නිම කර ඇත. එසේම, එතුමිය හැටන් හි නවීකරණය කරන ලද තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ද ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා එක්ව මාර්ගගත ක්‍රමය ඔස්සේ විවෘත කළාය. ඉන්දීය රජය මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන පහසුකම් රැසක් ගොඩනැගූ අතර තරුණ ප්‍රජාවගේ සේවා නියුක්තිය ඉහළ නැංවීමට ඉවහල් වන කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පරිගණක වැනි උපකරණ ලබා දුන්නේය.

6. මෙම සංචාරය ආර්ථික ක්ෂේත්‍රයේ ද්විපාර්ශවික නියැළීම් සඳහා තවදුරටත් ජවය සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. විවිධ අංශ නියෝජනය කරමින් ශ්‍රී ලංකාවට පැමිණි කර්මාන්ත ප්‍රධානීහු අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි ආයෝජන අවස්ථා සහ ශ්‍රී ලංකාවේ තිරසාර වාණිජ හවුල්කාරීත්වයන් සම්බන්ධයෙන් මහත් උනන්දුවක් දැක්වූහ. සංචාරය අතරතුර පැවති ව්‍යාපාරික සමුළුව අනාගත සහයෝගීතාවයන් සාකච්ඡා කිරීම සඳහා ඉන්දීය සහ ශ්‍රී ලංකා ව්‍යාපාරික ආයතන එකට එක් කළ වේදිකාවක් විය.

7. මුදල් අමාත්‍ය සීතාරාමන් මහත්මිය 2022 වසරේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රැස්වීම්වලදී ශ්‍රී ලංකාව වෙනුවෙන් අදහස් දැක්වූ අතර එය ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම සඳහා තීරණාත්මක විය. මුදල් අමාත්‍යතුමිය වශයෙන් එතුමියගේ භූමිකාව

ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 4ක විවිධාකාර සහය වේගවත් කිරීම සඳහා ඉතා වැදගත් විය.

***

***කොළඹ***
***2023 නොවැම්බර් 3***